කල්බදු මූල්‍යකරණ පනත යටතේ නිකුත් කරනු ලබන විධාන 2018 අංක 07                2018 ඔක්තෝබර් 1

## මෝටර් වාහන ආනයනය කිරීම අවම කිරීමේ ක්‍රියාමාර්ග

**2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනතේ 34 වන වගන්තිය යටතේ නිකුත් කරන ලදී.**

ආනයන සහ එහි ප්‍රතිඵලයක් ලෙස විනිමය අනුපාතිකය මත ඇතිවන අහිතකර බලපෑම අවම කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත 2018 ඔක්තෝබර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි පහත දැක්වෙන ක්‍රියාමාර්ග සකස් කර ගන්නා ලෙස නියම කරයි.

1. කල්බදු මූල්‍යකරණ පනත යටතේ නිකුත් කරන ලද 2018 අංක 02 දරන මෝටර් වාහන සඳහා ණය පහසුකම් ලබාදීමේ දී වටිනාකම් මත ණය අනුපාත විධානයන් හි 2.1 විධානය පහත පරිදි ප්‍රතිස්ථාපනය කෙරේ.

   මෝටර් වාහන මිලදී ගැනීමේ හෝ භාවිතා කිරීමේ අරමුණු සඳහා විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් ලබාදෙන ණය පහසුකම් නැවත දැනුම්දෙන තුරු එම වාහන වල වෙළඳපොළ වටිනාකමෙන් පහත දැක්වෙන ප්‍රතිශතයන් නොඉක්මවිය යුතුය.

   (i) ලියාපදිංචි නොකළ වාහන සහ පළමු ලියාපදිංචියෙන් පසු වසරකට වඩා අඩු කාලයක් ශ්‍රී ලංකාව තුළ භාවිතා කරන ලද ලියාපදිංචි වාහන සඳහා,

**වගු අංක 01 - වටිනාකම මත ණය අනුපාත**

| වාහන වර්ගය | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වාහන පන්තිය | විද්‍යුත් වාහන | වෙනත් |
|---|---|---|---|
| වාණිජ වාහන | C1, C, CE, D1, D, DE, G1, G, J | 90% | 90% |
| මෝටර් කාර්, ක්‍රීඩා උපයෝගී වාහන (SUV) හා වෑන් රථ | B [සැහැල්ලු ට්‍රක්රථ සහ තනි ආසන (single cab) කැබ් රථ හැර] | 90% | 50% |
| ත්‍රී රෝද රථ | B1 | 90% | 25% |
| වෙනත් ඕනෑම වාහන | A1, A, B පන්තිය යටතේ වර්ගීකරණය කර ඇති සැහැල්ලු ට්‍රක්රථ සහ තනි ආසන (single cab) | 90% | 70% |
| දෙමුහුම් මෝටර් කාර්, වෑන් රථ සහ ක්‍රීඩා උපයෝගී වාහන (SUV) | B [සැහැල්ලු ට්‍රක්රථ සහ තනි ආසන (single cab) කැබ් රථ හැර] | 50% | |

   (ii) පළමු ලියාපදිංචියෙන් පසු වසරකට වඩා වැඩි කාලයක් ශ්‍රී ලංකාව තුළ භාවිතා කරන ලද ලියාපදිංචි වාහන සඳහා අනුපාතය සියයට 70 ක් විය යුතුය.

ඩබ්. රණවීර
අධ්‍යක්ෂ, බැංකු නොවන මූල්‍ය
ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව